www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II |
| කාලය / காலம் / Time: පැය 02යි. | | |

නම:-........................................................ විභාග අංකයː-........................................................

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

01. එදා ජුදා සමාජයේ බරපතල වැරදිකරුවකුට හිමි වූ නින්දිත දඬුවම වූයේ,
 1. සිර භාරයට ගැනීම. 2. කුරුසි පත් කිරීම.
 3. ගල් ගැසීම. 4. දඬුකඳේ ගැසීම.

02. රෝමවරුන්ට ලියා ඇති හසුනට අනුව විපතේ දී කිතුනු අප කළ යුත්තේ,
 1. ඉවසිලිවන්ත වීම. 2. යටහත් පහත් වීම. 3. සාප කිරීම 4. කාර්යශීලී වීම

03. දෙවියන් වහන්සේ මිනිසා වෙත අනාවරණය වන ප්‍රබලතම මාර්ග නම්,
 1. යාච්ඤාව 2. දේව වචනය 3. දේවස්ථානය 4. කිතුණු ගීතය

04. මුල් කිතුනු සභාව කාලයේ පලස්තීනය යටත් කරගෙන සිටි අධිරාජ්‍යයා වන්නේ,
 1. රෝම 2. අරාබි 3. ග්‍රීක 4. පර්සියාව

05. ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් සමාන කර ඇත්තේ,
 1. ගව රැළකට 2. මල් පොකුරකට 3. පක්ෂීන්ට 4. බැටළුවන්ට

06. කිතු සමිඳුගේ සෙබළුන් වීමට අප සත්‍ය නැමති ......................... පැළඳිය යුතුයි. මෙහි හිස්තැනට සුදුසු වන්නේ,
 1. පාවහන් 2. පලිහ 3. කඩුවය 4. ඉගපටිය

07. අධි තක්සේරුවෙන් වැළකීම පිළිබඳ ලිපියක් ලියා ඇත්තේ,
 1. පාවුල් තුමා ය. 2. පේදුරු තුමා ය.
 3. ජොහාන් තුමා ය. 4. ලූක් තුමා ය.

08. "තම කම නැසීම" පිළිබඳව මහඟු ආදර්ශයක් අපට ලබා දෙන්නේ,
 1. ආදම් 2. මෝසෙස්
 3. ජේසුස් වහන්සේ 4. ස්නාවක ජොහාන්

09. සමිඳුන්ගේ දීමනාවකි.
 1. ප්‍රීතිය 2. පීඩා 3. ප්‍රඥාව 4. දැනුම



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

10. ''මද්‍ය පානය'' සමාන කර ඇත්තේ,
1. කේලාම්කරුවෙකුට 2. කලහකරුවෙකුට 3. මෝඩයෙකුට 4. නැණවතෙකුට

11. දේව කැඳවීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි,
1. මිල මුදල් 2. රැකියාව
3. ශුද්ධාත්ම දිරිගැන්වීම 4. අධ්‍යාපනය

12. පළමු වේද සාක්ෂිකයා ලෙස හඳුන්වනු ලබන්නේ,
1. ස්තේපන් 2. පාවුල් 3. මතෙව් 4. ජුදස්

13. ''දොර්කස්,'' යන නාමයේ අර්ථය වන්නේ,
1. වාසනාවන්තිය 2. කාලකණ්ණි
3. සිනාසීම 4. මුවදෙන

14. ''පොළොවේ සීමාන්තය දක්වා මාගේ සාක්ෂිකරුවෝ වන්න.'' මෙම ප්‍රකාශනය මගින් කිතුනු අපට ලැබෙන අභියෝගය නම්,
1. කිතු දහම හොඳින් හෝ නරකින් අන් අයට කියා දීම.
2. මහා සම්මන්ත්‍රණ පවත්වා ජනතාව බෞතීස්ම කිරීම.
3. දේව කැඳවීම තුළ ශුද්ධාත්ම මඟ පෙන්වීමෙන් දේව වචනය කියා දීම.
4. හාස්කම් හා සුව කිරීම් තුළින් ජනතාව ආකර්ශණය කර ගැනීමයි.

15. පුරාණ ගිවිසුමේ සත්ගුණවත් මිනිසා ලෙස හඳුන්වන්නේ,
1. ආදම් 2. ජෝෂුවා 3. නෝවා 4. ආරොන්

16. මෙපිබොෂෙත්ට ශාරීරික දුබලතා පැවතියත්, ඔහුගේ ජීවිතයට වටිනාකමක් ලබා දුන් රජ වන්නේ,
1. සාවුල් 2. දාවිත් 3. සලමොන් 4. සාමුවෙල්

17. අපි දෙවි පියාණන්ගෙන් ලද නව ජීවිත ස්වභාවය තුළ ඇති කර ගත යුතු ගුණාංගයක් වන්නේ,
1. ප්‍රේමය 2. කරුණාව 3. ඉවසීම 4. දම්වුකම

18. ජුදෙව් නොවන ජාතීන් වෙත සුභාරංචි ගෙන ගියේ,
1. පිලිප් 2. පාවුල් 3. ස්තෙපන් 4. සමාරිය ස්ත්‍රිය

19. මිනිසා පූර්ණත්වය කරා ළඟ වීමට නම්,
1. විවිධ අභියෝග හමුවේ නිශ්ශබ්දව සිටිය යුතු යි.
2. දෙවියන් වහන්සේගේ සරණ හා ශක්තිය ලැබිය යුතු යි.
3. දිනපතා දේව මෙහෙයට සහභාගි විය යුතු යි.
4. දේව කැඳවීම ලද්දෙක් විය යුතු ය.

20. ''ඔබගේ වචන මාගේ දෙපයට ................ මාගේ මාවතට ...................... '' මෙහි හිස්තැන්වලට සුදුසු වචන වන්නේ,
1. ලාම්පුවක් / එළියක් 2. පහනක් / ආලෝකයක්
3. ආලෝකයක් / මඟ පෙන්වන්නෙක් 4. පහනක් / එළියක්

(ලකුණු 2 x 20 = 40)




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තෝරා ගත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න. සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව 5යි.

අනිවාර්ය ප්‍රශ්නය

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) ශුද්ධ බයිබලය පුරාවටම දිව යන පොදු තේමාව කුමක් ද?

(ii) මාංසික තෘෂ්ණා 2ක් නම් කරන්න.

(iii) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 2ක් සඳහන් කරන්න.

(iv) පුරාණ ගිවිසුමේ රජවරුන් දෙදෙනෙක් නම් කරන්න.

(v) මුල් කිතුනු සභාවේ ප්‍රථම හාස්කම ලියන්න.

(vi) දේව වචනයේ ආලෝකය තුළින් අපට ලැබෙන දේවල් 2ක් ලියන්න.

(vii) දෙවියන් වහන්සේ අපව සුරකින අවස්ථා 2ක් ලියන්න.

(viii) ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණ වන අවස්ථාවේ දී ප්‍රේරිතයන් වෙත ප්‍රකාශ කර සිටියේ කුමක් ද?

(ix) දේශනාකාරයා සඳහන් කරන පරිදි යොවුන් වියේ දී සිහි කර යුත්තේ කවුරුන්ව ද?

(x) පාවුල් තුමා අපගේ ශරීරය සමාන කරන්නේ කුමකට ද?

(ලකුණු 2 X 10 = 20)

(02) (i) අතීතයේ ඉශ්‍රායෙල් ජනතාව දුක් පීඩා අවස්ථාවල දී පිහිට හා සරණ පැතුවේ කෙසේ ද? (ලකුණු 2)

(ii) ශුද්ධ බයිබලය තුළ දෙවියන් වහන්සේගෙන් පිහිට හා සරණය ලද අවස්ථා 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට ගත හැකි පියවර 5ක් ලියන්න. (ලකුණු 5)

(03) (i) දෙවියන් වහන්සේ තම සෙනඟව පෝෂණය කළ අවස්ථා 2ක් පුරාණ ගිවිසුම ඇසුරෙන් ලියන්න. (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ ජනතාව පෝෂණය කළ අවස්ථා සඳහන් කර එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(iii) කිතුනු දරුවෙකු ලෙස අද සමාජයේ වෙසෙන මිනිසුන්ගේ ජීවිත පෝෂණය කිරීම පිණිස ඔබට කළ හැකි ක්‍රියාවන් 5ක් ලියන්න. (ලකුණු 5)

(04) (i) ජේසුස් වහන්සේ සබත් දින කළ සුවකිරීම කුමක් ද? (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ එම රෝගියාව සුව කළ ආකාරය ලියන්න. (ලකුණු 3)

(iii) කිතුනු ප්‍රේමය තුළ රෝගීන් වෙනුවෙන් ඔබට කළ හැකි යහපත් ක්‍රියාවන් 5ක් ලියන්න. (ලකුණු 5)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(05) (i) කිතුනුවකු ලෙස දිවිගෙවන විට අපට ප්‍රබලම අභියෝගය එල්ල වන්නේ කාගෙන් ද?

(ලකුණු 2)

(ii) අප අද සමාජයේ ජීවත් වන විට විවිධ ස්වරූපයෙන් පැමිණෙන නපුරු බලවේගයන් 3ක් ලියන්න

(ලකුණු 3)

(iii) සමිඳුන්ගේ සේනාවේ යුද සෙබළකු ලෙස කිතුනු යුද මෙවලම්වලින් සන්නද්ධ වී කිතුනු මෙහෙවරෙ යෙදෙන ආකාරය පැහැදිලි කරන්න. (නිදසුන් සඳහා කිතුනු යුද මෙවලම් සඳහන් කළ යුතු යි.)

(ලකුණු 5)

(06) (i) ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතයක් අත්පත් කරගැනීමට අවශ්‍ය ගුණාංග 2ක් ලියන්න.

(ලකුණු 2)

(ii) නව ජීවිතයක් අපේක්ෂාවෙන් සිටින සමනළයෙකුගේ ජීවිතයේ අවස්ථා 3 සඳහන් කර එය කිතුනුවකුගේ ජීවිතයට සමාන කර ඇති ආකාරය ලියන්න. (ලකුණු 3)

(iii) ක්‍රිස්තුස් වහන්සේ හමුවීමෙන් ඔබ ලබන ජීවිතය මගින් නිවස, පාසල හා සමාජය ආලෝකමත් කිරීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 5ක් ලියන්න. (ලකුණු 5)

(07) පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දැහැමි මිනිසා තෝවා

(ii) පෙන්තකොස්ත දිනය

(iii) සාවුල් තුමාගේ හැරීම

(iv) නව තාක්ෂණය හා කිතුනු මෙහෙවර

(iv) ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් (ලකුණු 5 X 2 = 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk